**වගා ආධාර චක්‍රලේඛ අංක: 14**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ.
1989.02.03 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් සහ
තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් වෙත.

මාතෘකාව: **නැවත වගා සහ අලුත් වගා අවසර පත්‍ර නිකුත් කිරීම**

## 1.0 චක්‍රලේඛයේ පරමාර්ථය:

1.1 දැනට භාවිත කරන නැවත වගා සහ අලුත් වගා ඉල්ලුම් පත්‍ර දෙකින්ම ඉල්ලා සිටින්නේ එක සමාන තොරතුරුය. එබැවින් ඉදිරි කාලයේදී, නැවත වගාව සහ අලුත් වගාව සඳහා ඉල්ලුම් කිරීමට පොදු ආකෘති පත්‍රයක් මුද්‍රණය කරනු ඇත. එතෙක් දැනට භාවිත කරන නැවත වගා සහ/හෝ අලුත් වගා ඉල්ලුම් පත්‍ර දෙකින් කුමක් භාවිත කළද, අදාළ ආධාර ක්‍රමය යටතේ අවසර දීමට මෙම චක්‍රලේඛය මගින් ඉඩකඩ සැලසේ.

2.0 දැනට, මෙම අවසර පත්‍ර කට්ටල දෙකින් ඕනෑම අයදුම් පත්‍රයකින් ඉල්ලුම් කරන විට පහත සඳහන් අයුරු ක්‍රියා කරන්න.

2.1 එම ඉල්ලුම් පත්‍රය ප්‍රමාදයකින් තොරව මූලික පරීක්ෂණය සඳහා යොමු කරන්න.

2.2 මූලික පරීක්ෂණයේදී අයදුම්කරු ඉල්ලා ඇත්තේ නැවත වගාවට වුවත්, ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් තීරණය කරන පරිදි අලුත් වගා අවසර පත්‍රයක් නිකුත් කළ හැකිය. එසේම අලුත් වගාවට ඉල්ලා ඇති විට එය නැවත වගාව යටතේ සංවර්ධනය කළ යුතු බවට තීරණය කෙරේ නම්, ඒ සඳහා නැවත වගාවට අවසර දිය හැකිය. මේ අනුව අදාළ මූලික පරීක්ෂණ ආකෘතිය පුරවා වාර්තා එවීම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීගේ වගකීම වේ.

2.3 අදාළ ක්‍රමය පිළිබඳ කරුණු ඉල්ලුම්කරුට මූලික පරීක්ෂණ අවස්ථාවේදී තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් පැහැදිලි කර දිය යුතුය.

3.0 මේ අනුව, අදාළ අවසර පත්‍රය ප්‍රාදේශීය කාර්යාලය මගින් නිකුත් කළ යුතුය. මින් ඉදිරියට නැවත වගා සහ අලුත් වගා වේදී, විකල්ප ඉල්ලුම් පත සම්පූර්ණ කර එවන ලෙස ඉල්ලා සිටීමෙන් වගාකරුවන් අනවශ්‍ය අපහසුතා වයනට පත් නොකළ යුතුය.

(වී. කේ. නානායක්කාර)
සභාපති.

පිටපත්:
1. සාමාන්‍යාධිකාරී.
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී.
3. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්).
4. අභ්‍යන්තර විගණක.
5. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී.